## <u>පළමු යෝජනාව</u>

### ගමේ හෝ මීසම තුළ හෝ ඇති දෙවිදු යදින සංඝයක් හා එක්වීම

"එකිනෙකාට ප්‍රේම කරන්න එයින් ඔබ මාගේ ගෝලයෝ බව සියල්ලෝම දැන ගනිති."
(ජුවාංම 13: 34-35)

ජාත්‍යන්තර සමුළු වැනි විශේෂ වූ අවස්ථාවන් වලදී මිතුරු කම් හා ගොඩනැගුනු සංඝ අපට දැකිය හැකිය. මේවා කලාතුරකින් පමණක් ඇති වන එවා වෙති. එහෙත් ලෝකයේ නොයෙක් පෙදෙස් තුළ මෙම විශාල සංඝයේ කුඩා කොටස් ඉතා සුළුවෙන් හෝ දැක ගත හැක . මෙලෙස අප සහයෝගිතාවය අත්දකිනවිට හා අසීමිත එක්සත් භාවයේ උල්පත කිතු තුමන් බව දැන ගත් විට විශ්වාසය ගොඩ නැගීම ඇරඹේ.

මීසම් සංඝයක් හෝ කණ්ඩායමක් හට මිතුදමේ තෝතැන්නක් වීමට, එකිනෙකා හා එක්ව කල් ගෙවිය හැකි වීමට, දුර්වල අය, අමුත්තන් හා තම අදහස් වලට ගරු නොකරන අය උදෙසා විශේෂ ලෙස සැලකිළිමත් වීමට අප සැම පෙළඹිය යුතුය.

- සැම දෙනා හට යෝජනාවක්:

ඔබ විසින් තෝරා නොගත් පිරිසක් සමඟ උවද ඉරිදා ජන වන්දනාව හා වෙනත් ක්‍රිකාරකම් තුල නියැලී ඔබට සහයෝගීතාව අත්දැකිය හැකිද?

- මීසම් සේවා නායකයින් හට යෝජනාවක්:

තරුණයන්ට සවන් දෙන්න. ඔවුන්ගේ අදහස් වටහාගෙන ඒවා කෙරෙහි සැලකිළිමත් වන්න. ඒ පිළිබඳ වැඩිහිටියන් දැනුවත් කරන්න.

## <u>දෙවන යෝජනාව</u>

### අපව සීමා කරන මායිම් අභිබවා, මිතුදම වර්ධනය කිරීම.

"මාගේ සහොදරයන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට උවද, ඔබ එසේ කලානම් එය කළේ මටය" (මතෙව් 25:40)

ජේසුස් වහන්සේ තමන් හට මුන ගැසුනු සැම කෙනෙක් කෙරෙහීම අවධානය දැක්වූවා, විශේෂයෙන්ම ළමුන්, දිළින්දන් හා නොවැදගත් යැයි සැලකූ අය උදෙසා'. එතුමන්ව අනුගමනය කරමින් අපටත් මායිම් පසු කර ,දිළින්දන් හා එක් විය හැක. එලෙසින්, සියළු ක්‍රිස්තියානීන් හා අනෙක් ආගම් අදහන්නන් සමඟද එක්ව සහයෝගීතාවයේ ක්‍රියා අපට ඇරඹිය හැක. ශාරීරිකව හෝ අධ්‍යාත්මිකව කෙනෙකු දිළිඳු උවත්, සහයෝගීතාවය තුළ දෙයාකාරයටම සහන සළසයි.

- සැම දෙනා හට යෝජනාවක්:

මිත්‍රත්වයක් හෝ සහයෝගීතාවයක් පෙන්වීම සඳහා එක්වසරකට අසල් වැසි ජන කොටසක්, විශේෂයෙන්ම නෙරපා දැමුවන් ,දිළින්දන්, රෝගීන්, දුර්වලතා තුළ පෙළෙන්නන්, අත් හැර දැමූ දරුවන්, රැකියා නොමැති වුවන් , සංක්‍රමිකයන් වැනි අය තෝරා ගෙන ඔවුන් සමඟ ක්‍රියා කිරිම.

- මීසම් සේවා නායකයින් හට යෝජනාවක්:

තම ප්‍රදේශයේ තරුණයින් හට සහයෝගීතාවය තුළ ක්‍රියා කළ හැකි අවස්ථා අඳුනා ගැනීමට උදව් වීම.

## තුන් වන යෝජනාව

### අන් අය සමඟ නොකඩවා බෙදා ගැනීම හා යාච්ඤාව

**"යම් තැනක දෙදෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස්ව සිටිත්ද ,එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි".** (මතෙව් 18:20)

සමහර තරුණයින් හට වේදනාබර සිදුවීම්, අත්හැර දැමීම්, හුදකලා වීම් හෝ ලෝකයේ සිදුවන අසාධාරණකම් අත්දැකීම නිසා, දෙවිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම අපහසු කරුණක් බවට පත්ව තිබෙනවා. ඔවුන් හට විශ්වාසය වනාහි අවධානමකි. එනම්, ඇදහිල්ලේ අවධානමකි. කාත් සමඟ ගමන් කරමින් මට මාගේ විශ්වාසය ගැන මෙනෙහි කළ හැකිද?

- සැම දෙනා හට යෝජනාවක්:

සතියකට හෝ මාසයකට වරක්වත් තමන් තුළ තිබෙන ප්‍රශ්න එලෙසින්ම තබා නොගෙන, අන් අය සමඟ බෙදා ගැනීම. සැවොම එක්ව සුවිශේෂ පාඨයක් හෝ වෙනත් බයිබල් පාඨයක් කියවීම. ගීතිකා , දේව වචනය කියවීම් හා නිෂ්ශබ්ධතාවය තුළ එක්ව දෙවිඳු යැදීම.

- මීසම් සේවා නායකයින් සඳහා යෝනාවක්:

දෙවිඳු යදින හා බෙදාගන්නා කුඩා කණ්ඩායම් සඳහා සහයෝගය දැක්වීම . ඔවුන් හට විවෘතව කටයුතු කරණ හා අන් අයට පිළිගන්නා සමූහයක් ලෙස සිටීමට උදව් වීම.

## හතර වන යෝජනාව

### කිතු තුමන්ට ආදරය කරන්නන් අතර සහයෝගීතාවය වඩාත් ඔප නැංවීම.

**"ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයයි".** (1 කොරි 12:27)

සමාජය තුල අපට වඩා වෙනස් ආකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේට ආදරය කරන්නන් සිටිති. ක්‍රිස්තියානුවන් යැයි අපට පවසන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ නාමය නිසාය. ඥානස්නාපනය තුළ ක්‍රිස්තුස් වහන්සේ හා සමගි වී ක්‍රිස්තියානින් නැමති අනන්‍යතාවය අප ලබාගන්නෙමු. එම නිසා, අප එකිනෙකාගේ සභා වල අනන්‍යතාවයට වඩා අපගේ ක්‍රිස්තියානී අනන්‍යතාව ඉස්මතු කරන්නට උත්සාහ දරමු.

අප අතර ඇති වෙනස්කම් සහයෝගීතාවය සඳහා නොගැලපේ යැයි පෙනුනද, එය වෙන් වන්නට හේතුවක් නොවේ. ජේසු තුමන් මෙලොව විසූ කාලය තුළ, මායිම් අභිබවා පියවර තැබුවා. කුරුසිය මත එක් අන්තයක සිට අනෙක් අන්තය දක්වා බෙදී ගියවුන් අතර දැත් දිගු කරණු ලැබුවා. ක්‍රිස්තියානීන් හට

කිතු තුමන් අනුගමනය කරමින් ලෝකයට ආලෝකයක් වන්නට නම්, බෙද වී සිටිය නොහැක. ශුද්ධාත්මයානන් වහන්සේ අපව එක්සත් කරණු ලබති.

- සෑම දෙනා හට යෝජනාවක්:

අපට වඩා වෙනස් සංඝයක්, මීසමක්, සංවිධානයක්, සභාවක් හෝ කිතුනු හවුලක් වෙතට යොමු වී ඔවුන් හා එක්ව ක්‍රියා කිරීම. අන්අයව හමුවීමට යාම හා ඔවුන්ට ආරාධනා කිරීම. සරළ යැදුමක් තුළින් කිතු තුමන් වෙත හැරී එක් වහලක් යට සිට යැදීම. මේ තුලින් සම්පූර්ණ සහයෝගීතාවයක් තුළ ජීවත් වීමට බලාපොරොත්තු ඇති කර ගැනිම.

- මීසම් සේවා නායකයින් සඳහා යෝනාවක්:

ආගමික කටයුතු තුළදී හැකි තාක් දුරට අනෙක් සභා ක්‍රිස්තියානීන් හා එක්ව කටයුතු කිරීම. අන් අය නොමැතිව මොන යම් ක්‍රියාවක්වත් නොකිරීම.

## 2015 ටයිසේ හිදී ...

## “නව සහයෝගිතාවයක් කරා”

**සංඝයේ 75 වන සංවත්සරය**<br>
**රොජර් සහෝදරතුමාගේ 100 වන ජන්ම සංවත්සරය**<br>
**(1915 මැයි 12 – 2015 අගෝස්තු 16)**

- 2015 මැයි:

රොජර් සහෝදරතුමා පිළිබද මතකය හා එතුමාගේ කිතු තුමන් අනුගමනය කිරීමට ලද කැඳවීම ආවර්ජනය කර, සියළුම තරුණ කැළ තමා ජීවත් වන ප්‍රදේශයේ සිට යාච්ඤා යෝගිව හා සහයෝගිතාවයේ ක්‍රියාවන් තුළ නියැලීම.

- මැයි 10 වන ඉරිදා:

තුති පිදීමේ මෙහෙයක් උදෙසා, සංඝය විසින් ටයිසේ අවට ජනයා හට ආරාධනා කිරීම.

- 2015 ග්‍රිස්මය :

සෑම සතියකම ජාත්‍යන්තර වැඩිහිටි තරුණයන්ගේ රැස්වීම. මේ හා සමගාමීව, අවසන් වසර තුනක ගමන් මග පූර්ණත්වයට පත් කරමින්, සෑම මහද්වීපයකම තරුණ කැළගේ සහභාගිත්වයෙන් වැඩ මුලු පැවැත්වීම.

- ජූලි 05 – 12:

වර්තමානයේ පැවදි කැඳවීමේ යෝග්‍යතාවය යන මැයෙන් තරුණ පැවිද්දන් උදෙසා සම්මන්ත්‍රණය. කතෝලික හා වෙනත් සභාවල තාපසාරාම හා සංඝ මගින් නොයෙක් ඉදිරිපත් කිරීම්ද මේ සමඟ සිදුවේ.

- අගෝස්තු 9 – 16

තරුණ කැළගේ නව සහයෝගිතාවයක් උදෙසා හමුව.

- අගෝස්තු 16 වන ඉරිදා හවස:

ශුද්ධවූ සභා නායකයින්ගේ හා සැහැදැවත් සැමගේ සහභාගිත්වය තුළ රොජර් සහෝදරතුමාගේ මතක සටහන් උදෙසා තුති දීමේ යැඳුමක්.

- අගෝස්තු 30 - සැප්තැම්බර් 6:

'දේව ධාර්මික චින්තනය උදෙසා රොජර් සහෝදරතුමාගේ මෙහෙවර', යන මැයෙන් තරුණ දේව ධර්මධරයන් සඳහා, නොයෙක් රටවල විවිධ සභා සාමාජිකයන් විසින් වැඩ සටහන් ඉදිරිපත් කරනු ලැබීම.